PAFFREL
නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.
சுதந்திரமானதும் நீதியானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.
PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS

මැතිවරණ කොමසාරිස්තුමා, 2015.07.20

මැතිවරණ කොමසාරිස් කාර්යාලය,

රාජගිරිය

මැතිවරණ කොමසාරිස්තුමනි,

**අමාත්‍යවරුන් භාවිතා කරන වාහන සඳහා මුදල් අය කිරීම.**

මෙවර මැතිවරණයේදී රාජ්‍ය බලය සහ රාජ්‍ය දේපල අවභාවිතය වළක්වන්නට ඔබතුමා ගනු ලබන උත්සහය අප බෙහෙවින් අගය කරමු. එමෙන්ම ඔබතුමාගේ උපදෙස් සැළකිල්ලට ගනිමින් අමාත්‍යවරුන් භාවිතා කරන වාහන සඳහා රු. 100,000.00 මුදලක් අය කිරීමට ගනු ලැබූ තීන්දුව අපි බෙහෙවින් අගය කරන අතර එය රාජ්‍ය සම්පත් අවභාවිතා කිරීම වැළැක්වීමට ගනු ලැබූ සාධනීය පියවරකි.

කැබිනට් අමාත්‍යවරුන් මෙන්ම පළාත් සභා ප්‍රධාන අමාත්‍යවරුන් කිහිපදෙනෙකුම සහ පළාත් පලාන ආයතන ප්‍රධානීන් කිහිපදෙනෙකු ද මෙම මැතිවරණයේදී තරඟ කරන බැවින් සහ ඔවුන් තම ධූර දරමින්ම අපේක්ෂකත්වය සමග මැතිවරණ ප්‍රචාරක කටයුතු වල යෙදෙන බැවින් ඔවුන්ගෙන්ද මෙම මුදල් අය කිරීමට වැඩපිළිවෙලක් යොදන ලෙස කාරුණිකව ඉල්ලමි.

එමෙන්ම මෙම කටයුත්ත යථාර්තයක් වීමට නම් අදාල අමාත්‍යවරුන් භාවිතා කරන වාහන ලැයිස්තු ගත කර මැතිවරණ ආරම්භයේදීම ඊට අදාල ගාස්තු කරන වැඩපිළිවෙලක් සකස් කළ යුතු අතර එසේ ගාස්තු අය කලේද යන්න මැතිවරණ කොමසාරිස්වරයාට වාර්තා කරන ක්‍රමවේදයක් සකස් කිරීමට ආදාල අමාත්‍යාංශ ලේකම්වරුන්ට හෝ ඊට සුදුසු ක්‍රමවේදයක් සැකසීමට හැකි නම් එකී උත්සහය යථාර්තයක් වනු ඇත.

මෙයට,

විශ්වාසී,

රෝහණ හෙට්ටිආරච්චි

විධායක අධ්‍යක්ෂක

# 12/3, Robert Terrace, Robert Gunawardana Mawatha, Colombo 06, Sri Lanka.
Tel : (+94) 11 2514441 / 11 2514442 Fax : (+94) 11 2514443
E-mail : paffrel@sltnet.lk Website : www.paffrel.lk